# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**7 ශ්‍රේණිය**

**භූගෝල විද්‍යාව - I/II**

නම/ විභාග අංකයඃ ........................................

කාලය පැය 2 යි

### I කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

★ **අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) පෘථිවි ගෝලයේ මතුපිට වර්ග ප්‍රමාණය
   1) මිලියන $65610km^2$ පමණ වේ.
   2) මිලියන $510km^2$ පමණ වේ.
   3) මිලියන $540km^2$ පමණ වේ.
   4) මිලියන $250km^2$ පමණ වේ.

2) පෘථිවිය සූර්යයා වටා පරිභ්‍රමණය වීමට ගතවන කාලය
   1) දින 265 කි 2) දින 365 කි 3) පැය 24 කි 4) පැය 12 කි

3) ලෝකයේ විශාලතම සාගරය වන්නේ
   1) අත්ලාන්තික් 2) පැසිෆික් 3) ඉන්දියන් 4) ඇන්ටාක්ටික්

4) ශ්‍රී ලංකාවේ ප්‍රධාසන වාණිජ නගරය ලෙස සැලකෙන්නේ
   1) මහනුවර
   2) කොළඹ
   3) ගාල්ල
   4) ජයවර්ධනපුර කෝට්ටේ

5) ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් වන්නේ පටු මුහුදු තීරයකිනි. එය හඳුන්වන සමුද්‍ර සන්ධිය කුමක්ද?
   1) මලක්කා 2) පෝක් 3) බෙංගාල 4) ජිබෝල්ට්‍රා

★ **ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා අදාළ පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.**

6) රට අභ්‍යන්තරයේ පිහිටි මුහුදක් ලෙස ........................................... සැලකිය හැකිය.

7) පෘථිවි පෘෂ්ඨයෙන් ................................. ක් ජලයෙන් ද 29% ක් ගොඩබිම් ප්‍රදේශ වලින් ද වැසී ඇත.

8) දකුණු ආසියාතික රටක් වන ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව .................................... කි.

9) පෘථිවිය තම අක්ෂය වටා ගමන් කිරීම .................................... නමින් හැඳින්වේ.

10) අක්ෂාංශ දේශාංශ පදනම් කරගෙන රටක නිවැරදිව පිහිටීම දැක්වීම ............................... පිහිටීම ලෙස හැඳින්වේ.

**( 92%, 71%, භ්‍රමණය, කැස්පියන්, නිරපේක්ෂ)**

★ **අංක 11 සිට 15 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න.**

11)වුන්ඩිකුලම් කුරුලු අභය භූමිය උතුරු පලාතේ පිහිටා තිබේ. ( )

12)මැඩගස්කරය දූපත පිහිටා ඇත්තේ පැසිපික් සාගරයේ ය. ( )

13)වෙරළ මායිමේ සිට නාවික සැතපුම් 12 ක් රාෂ්ට්‍රීය මුහුදු සීමාව වේ. ( )

14)පෘථිවිය ගෝලාකාර වස්තුවක් ලෙස සැලකුව ද එය පූර්ණ ගෝලයක් නොවේ. ( )

15)සීගිරිය, දඹුල්ල, රිටිගල, කතරගම ශ්‍රී ලංකාවේ පිහිටි ශේෂ කඳු වේ. ( )

★ **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු යොදු හිස්තැන් පුරවන්න.**

16)පෘථිවි ආදර්ශ ගෝලයේ උතුරු අර්ධගෝලය හා දකුණු අර්ධ ගෝලය වෙන්කරන අක්ෂාංශ රේඛාව නම් කරන්න. ……………………………………………………………………………………

17)බස්නාහිර පළාතට අයත් නොවන නිදහස් වෙළඳ කලාපය කුමක්ද?

……………………………………………………………………………………

18)ලෝකයේ විශාලතම දූපත නම් කරන්න. ……………………………………………………

19)ශ්‍රී ලංකාවේ කොළඹ සිට සංගමන්කන්ද තුඩුවට දිග කිලෝ මීටර් වලින් ලියන්න.

……………………………………………………………………………………

20)මැයි සිට ජූලි දක්වා කාලයේ ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ක්‍රමය හඳුන්වන නම කුමක්ද?

……………………………………………………………………………………

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **අනෙක් ප්‍රශ්න අතුරින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව 05කි.**

01)




i. ඉහත සිතියමේ A, B, C, D, E වලින් සඳහන් කර ඇති මුහුදු නම් කරන්න. (ල 5)

ii. F අක්ෂරයෙන් දක්වා ඇති ලොව විශාලතම දූපත නම් කරන්න. (ල 1)

iii. G හා H රේඛා දෙක නම් කරන්න. (ල 2)

iv. I, J, K, L, වලින් දක්වා ඇති රටවල් හතර නම් කරන්න. (ල 4)

v. M, N, O, P ලෙස දක්වා ඇති සාගර හතර නම් කරන්න. (ල 4)

02)

i. දේශාංශ 180° රේඛාව හා දේශාංශ 0 රේඛාව හඳුන්වන නම් ලියන්න. (ල 2)

ii. පෘථිවියේ භ්‍රමණය හා පරිභ්‍රමණය කෙටියෙන් හඳුන්වන්න. (ල 4)

iii. ආදර්ශ ගෝලයක් ඇඳ සමකය, කර්කටක නිවර්තනය, මකර නිවර්තනය, ආක්ටික් වෘත්තය, ඇන්ටාක්ටික් වෘත්තය යන අක්ෂාංශ ලකුණු කර ඇඳ පෙන්වන්න. (ල 5)

03)

i. ශ්‍රී ලංකාව අවට ඇති දූපත් රාජ්‍යයන් දෙකක් නම් කරන්න. (ල 2)

ii. ලොව ප්‍රධාන මහද්වීප දෙකක් හා සාගර දෙකක් පිළිවෙළින් ලියන්න. (ල 4)

iii. සාගරයෙන් මිනිසාට ලැබෙන ප්‍රයෝජන දෙකක් විස්තර කරන්න. (ල 5)

04)

i. තෙත් කලාපයේ සීමාවන් සේ සැලකෙන ගංගා දෙකක් නම් කරන්න. (ල 2)

ii. තෙත් කලාපීය භූ දර්ශකයේ කැපී පෙනෙන ලක්ෂණ හතරක් ලියන්න. (ල 4)

iii. අධික වර්ෂාපතනය මෙම ප්‍රදේශයේ ජන ජීවිතයට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ල 5)

05)

i. කඳුකර භූ දර්ශනයේ කැපී පෙනෙන භෞතික ලක්ෂණ දෙකක් ලියන්න. (ල 2)

ii. යාපන අර්ධද්වීපය තුළ සිදුකෙරෙන මානුෂ ක්‍රියාකාරකම් හතරක් ලියන්න. (ල 4)

iii. උතුරු පළාත සංචාරකයින් ආකර්ෂණයට ලක්වී ඇත්තේ කුමන කරුණු නිසා දැයි විස්තර කරන්න. (ල 5)

06)

i. ශ්‍රී ලංකාවේ වැඩිම දිග ගණනය කිරීමට යොදගන්නා ස්ථාන දෙක නම් කරන්න. (ල 2)

ii. ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප තුන නම් කරන්න. (ල 4)

iii. ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන ක්‍රම තුන නම් කර එකක් විස්තර කරන්න. (ල 5)

07)

i. ජාතික උරුම ප්‍රධාන වශයෙන් බෙදෙන කොටස් දෙක නම් කරන්න. (ල 2)

ii. ශ්‍රී ලංකාවේ ස්වභාවික ජාතික උරුම නිර්මිත ස්ථාන දෙකක් නම් කරන්න. (ල 2)

iii. රටක අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු වීම තුළින් ඇතිවන යහපත් ප්‍රතිඵල දෙකක් ලියන්න. (ල 2)

iv. ආදිවාසි ජනතාව ජීවත් වන ප්‍රදේශ දෙකක් නම් කර ඔවුන් නූතන මානව සමාජයට අනුවර්තනය වෙන ආකාරය පැහැදිලි කරන්න. (ල 5)